පළාත් සභා පැරණි ක්‍රමයට පවත්වන්න විපක්ෂය-නිරීක්ෂණ සංවිධාන 41ක එකඟතාවක්

කාන්තා-තරුණ නියෝජනය සියයට 25ක් කරයි

ඒකාබද්ධ ප්‍රකාශයකටත් අත්සන්

හෙරංජලා වික්‍රමසිංහ

පළාත් සභා මැතිවරණය තවදුරටත් ප්‍රමාද නොකර කඩිනමින් පැවැත්විය යුතු බවටත්, ඒ සඳහා 2017 අංක 17 දරන පනතට පෙර පැවති මැතිවරණ ක්‍රමය යළි ක්‍රියාත්මක කළ යුතු බවටත් විපක්ෂයේ දේශපාලන පක්ෂ සහ මැතිවරණ නිරීක්ෂණ සංවිධාන බහුතරයක් ඊයේ (26) ප්‍රළුල් එකඟතාවකට පැමිණෙමින් ඒකාබද්ධ ප්‍රකාශයකට අත්සන් තැබූහ.

මෙම එකඟතාව පළ වූයේ පැත්රල් සංවිධානයේ මූලිකත්වයෙන් කොළඹ ෂෙක්ටර් කොඩිබැඳුව ගොවි කටයුතු පුහුණු හා පරිදර්ශන ආයතනයේ පැවති විශේෂ සාකච්ඡාවකදීය.

දේශපාලන පක්ෂ ලේකම්වරුන් හා නියෝජිතයන් මෙන්ම නිරීක්ෂණ සංවිධාන නියෝජිතයන් ද සම්බන්ධ වී සිටි එම සාකච්ඡාවේදී පළාත් සභා මැතිවරණය පැවැත්වීමේ වැදගත්කම, පළාත් සභා මැතිවරණය කල්යෑමට හේතු වූ කරුණු මෙන්ම කඩිනමින් පළාත් සභා මැතිවරණය පැවැත්වීමට ගත යුතු පියවර සම්බන්ධයෙන් ද සාකච්ඡාවට ලක් වීය.

එම සාකච්ඡාවට සම්බන්ධ වී සිටි විපක්ෂයේ දේශපාලන පක්ෂ හා නිරීක්ෂණ සංවිධාන 42 අතුරින් එක් දේශපාලන පක්ෂයක් හැර අනෙකුත් සියලුම පක්ෂ මෙම ඒකාබද්ධ ප්‍රකාශයට අත්සන් තැබූ අතර, එම ප්‍රකාශය පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවටත් ආණ්ඩු පක්ෂය වෙතත් යොමු කිරීමට ද මෙහිදී තීරණය විය. එමෙන්ම ස්වේච්ඡා පදනමක් මත කාන්තා සහ තරුණ නියෝජනය සියයට 25ක් ලෙස සහතික කිරීමට ද මෙහිදී එකඟතාව පළ විය.

විපක්ෂය නියෝජනය කරමින් එක්සත් ජාතික පක්ෂයේ මහලේකම් තලතා අතුකෝරළ, සමඟි ජන බලවේගය නියෝජනය කරමින් එහි මහලේකම් පා.ම. රංජිත් මද්දුම බණ්ඩාර, ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහලේකම් හිටපු පා.ම. සාගර කාරියවසම්, පොදුජන එක්සත් පෙරමුණ නියෝජනය කරමින් එහි ලේකම් හිටපු අමාත්‍ය ලසන්ත අලගියවන්න, දෙවන පරපුර නියෝජනය කරමින් එහි ප්‍රධාන ලේකම් උව්දු වීජේවීර, එක්සත් සමාජවාදී පක්ෂයේ ප්‍රධාන ලේකම් සිරිතුංග ජයසූරිය, ඉලංකෙයි තමිල් අරසු කච්චි පක්ෂය නියෝජනය කරමින් පා.ම. මොහොක්කියන් රාජමාණික්කම්, ශ්‍රී ලංකා මහජන පක්ෂය නියෝජනය කරමින් එහි ජෙෂ්ඨ උප සභාපති සමර සේනානායක, ඊ.පී.ඩී.පී. සංවිධානය නියෝජනය කරමින් එහි මධ්‍යම කාරක සභික එම්.අයි. මුරුගන්, එක්සත් ජනරජ පෙරමුණේ ලේකම් බන්දුල චන්ද්‍රසේකර, අබිල ඉලංගෙයි ද්‍රවිඩ මහාසභා පක්ෂය නියෝජනය කරමින් එහි නායක ආචාර්ය කේ. විග්නේශ්වරන්, දමිළ ප්‍රගතිශීලී සන්ධානය නියෝජනය කරමින් එහි නායක පා.ම. මනෝ ගණේෂන්, එක්සත් වාමාංශික පෙරමුණ නියෝජනය කරමින් එහි මධ්‍යම කාරක සභික ආචාර්ය ජයම්පති වික්‍රමරත්න, මලෙයග අරසියල් අරංගම් නියෝජනය කරමින් එහි ප්‍රධාන ලේකම් හිටපු පා.ම. එම්. තිලකරාජ්, ජනසෙත පෙරමුණ නියෝජනය කරමින් එහි සභික ඩබ්.ඩී.එස්. වීරසිංහ, කොමියුනිස්ට් පක්ෂය නියෝජනය කරමින් හිටපු පා.ම. වීරකුමන වීරසිංහ, සමාජවාදී ජනතා පෙරමුණ නියෝජනය කරමින් එහි සාමාජික විල්ෆ්‍රඩ් ජයසිංහ, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ නියෝජනය කරමින් එහි සාමාජික පී. තිලකසිරි, ශ්‍රී ලංකා මුස්ලිම් කොංග්‍රසය නියෝජනය කරමින් එහි මහලේකම් එසාම් කාරියප්පර්, පිළිකුරු හෙළ උරුමය නියෝජනය කරමින් එහි ප්‍රධාන ලේකම් නාලක පෙරේරා යන මහත්වරු ද සහභාගි වූහ.

මීට අමතරව 'ව්ව්' මැතිවරණ නිරීක්ෂණ ආයතනයේ අනුශාසක, මැතිවරණ කොමිෂන් සභාවේ හිටපු සභාපති මහින්ද දේශප්‍රිය, ප්‍රජාතන්ත්‍රවාදී මැතිවරණ නිරීක්ෂණ හා අධ්‍යයන ආයතනයේ විධායක අධ්‍යක්ෂ මංජුල ගජනායක, සැසෙග් සංවිධානයේ විධායක අධ්‍යක්ෂ මනාප් මකීන්, ජාතික මැතිවරණ නිරීක්ෂණ මධ්‍යස්ථානයේ ජාතික සංවිධායක රසාංග තර්සිවන්දු යන මහත්ම මහත්මීහු ඇතුළු පිරිසක් ද මීට සහභාගි වී සිටියහ.

ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් මෙම සාකච්ඡාවට ජාතික ජන බලවේගයේ මහලේකම් විශේෂඥ වෛද්‍ය නිහාල් අබේසිංහ මහතා සහභාගි වූ අතර, පළාත් සභා ජන්ද පිළිබඳ කුමන මැතිවරණ ක්‍රමයක් යටතේ පැවැත්විය යුතු ද යන්න සොයා බලා වාර්තා කිරීමටත්, ඒ පිළිබඳව සිය යෝජනා සහ නිර්දේශ ඉදිරිපත් කිරීමටත් පත් කළ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව නියෝජනය කරන විපක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සිව්දෙනාම ද මීට සහභාගි වී සිටියහ.